චක්‍රලේඛ අංක : 93/6 – සමාජ සේවා දෙපාර්තමේන්තුව

## මහජනාධාර කටයුතු

### සමාජ සේවා ආධාර

1. මහජනාධාර පහත සඳහන් පරිදි වර්ග කළ හැකිවේ.

01. මහජනාධාර මාසික දීමනා.
02. පිළිකා රෝගාධාර දීමනා.
03. ක්ෂය රෝගාධාර දීමනා.
04. ලාදුරු රෝගාධාර දීමනා.
05. මහජනාධාර ලබන්නන් පුනරුත්ථාපන දීමනා.

1.1 මහජනාධාර මාසික දීමනා ලැබීමට සුදුස්සෝ

වෙනත් ආදායම් මාර්ගයන් නොමැති පහත සඳහන් අය –

I. රෝගීන්, වයෝවෘද්ධයින්, ශාරීරික හා මානසික ආබාධිතයින් හා ඔවුන් ගේ යැපෙන්නන්.

II. යම් ශාරීරික දුබලතාවයක් හෝ දරුවන් බලා ගැනීමට සිදුවී ඇති නිසා හෝ යම්කිසි කාර්යයක නිරත වී පවුල රක්ෂා කිරීමට නොහැකිව සිටින දරුවන් සහිත වැන්දඹු කාන්තාවන්.

III. ස්වාමි පුරුෂයා විසින් අත්හල කාන්තාවන් හා ස්වාමි පුරුෂයා සුවකළ නොහැකි රෝගයකින් පෙළෙන හා සිරගතවීම නිසා ඔවුන්ගේ ආධාරය පවුල රක්ෂා කිරීමේදී ලබාගත නොහැකි යැපීමට කුඩා දරුවන් සිටින කාන්තාවන්.

IV. අවු. 16 ට අඩු අනාථ ළමයින් හා යම්කිසි හේතුවක් නිසා තම දෙමාපියන්ගේ පිළිසරණ අහිමි වූ අවු. 16ට අඩු ළමයින් හා මානසික හා ශාරීරික ආබාධිත ළමයින් සඳහා.

1.2 මහජනාධාර ගෙවියයුතු සීමාවන්.

| | | |
|---|---|---|
| තනිපුද්ගලයකුට මාසයකට | රු. | 100/= |
| යැපෙන එක් අයකු ඇති පවුලකට මසකට | රු. | 120/= |
| යැපෙන දෙදෙනෙකු ඇති පවුලකට මසකට | රු. | 150/= |
| යැපෙන තිදෙනෙකු ඇති පවුලකට මසකට | රු. | 180/= |
| යැපෙන සිව්දෙනෙකු ඇති පවුලකට මසකට | රු. | 210/= |
| යැපෙන පස්දෙනෙකු ඇති පවුලකට මසකට. | රු. | 250/= |
| යැපෙන පස්දෙනෙකුට වැඩි පවුලකට මසකට | රු. | 300/= |

ඒ අනුව අවම මුදල රු. 100/= වන අතර, උපරිම මුදල රු. 300/= දක්වා මහජනාධාර ගෙවිය යුතු වේ. කොළඹ ගාල්ල හා මහනුවර නගරසභා සීමාතුළ එම නගරසභා මගින් තීරණය කරනු ලබන ප්‍රමාණයන් ගෙවනු ලැබේ.

1.3 **මහජනාධාර අයදුම් කළයුතු ආකාරය**

ගාල්ල, කොළඹ, මහනුවර යන මහ නගරසීමාව තුළ පදිංචි වී සිටින අය නම් අදාළ මහ නගර සභාවේ පුණ්‍ය කොමසාරිස් තුමා හමුවී ඉල්ලීම ඉදිරිපත් කළ යුතුයි. දිවයිනේ වෙනත් ප්‍රදේශයන් ජීවත් වන අය ප්‍රදේශයේ ග්‍රා.නි. හමුවී තමන්ගේ අවශ්‍යතාවය පැවසිය යුතුය.

අයදුම්කරු විසින් සම්පූර්ණ කිරීම සඳහා ස.සේ./ම.ආ.01 ආකෘති පත්‍රය ග්‍රා.නි. ගෙන් ලැබෙනු ඇත. එය සම්පූර්ණ කර නැවත ග්‍රා.නි. ට භාරදීමෙ පසු ග්‍රා.නි. විසින් ස.සේ./ම.ආ./02 ආකෘතිය ද පුරවා ප්‍රා.ලේ. ට භාර දිය යුතුය. පසුව සමාජ සේවා නිලධාරියකු අදාල පුද්ගලයා හමුවී පවුලේ තොරතුරු හා ආදායම් තත්වය ගැන විමසනු ඇත. මහජනාධාරයක් ලබාගැනීම සුදුසුකම් ඇත්නම් ළඟම ඇති තැපැල් කාර්යාලයෙන් එම ආධාර මුදල ලබා ගැනීමට හැකි වනසේ ඉන්පසු සමාජ සේවා නිලධාරී කටයුතු කළ යුතුය. මහජනාධාර ගෙවීමේ ඉල්ලුම් පත්‍රයේ තොරතුරු ග්‍රාම නිලධාරී විසින් සහතික කර ස.සේ./ම.ආ. 02 ආකෘති පත්‍රය ද සමඟ සමාජ සේවා නිලධාරී විසින් නිර්දේශ කළයුතු අතර, ප්‍රාදේශීය ලේකම් විසින් මහජනාධාර මුදල ගෙවීමට අනුමැතිය ලබාදිය යුතුයි.

1.4 **මහජනාධාර ලබන්නා රෝගියකු වී එන්නැත්වූ අයෙකු නම් මහජනාධාර ලබා දියයුතු ආකාරය**

ඔහුට මහජනාධාර මුදල් ලබා ගැනීමට ළඟම ඇති තැපැල් කාර්යාලයට යෑමට නොහැකි නම් ඔහු වෙනුවෙන් දරුවකුට හෝ ඥාතියකුට එම මුදල ගෙවන ලෙස ඔහු විසින් ඉල්ලීමක් කළ විට එම අයට මාසිකව තැපැල්හලට ගොස් එම මුදල ලබා ගැනීමට කටයුතු කළ හැකිය.

මෙවැනි අවස්ථාවකදී ග්‍රා.නිලධාරියා ගෙන් ඉල්ලීමක් කළවිට ඔහු විසින් සහති කරන ලද නියෝජිත බලපත්‍රයක් (අංක.එස්.එස්./පී/4) ලබාදෙනු ලැබේ. එම නියෝජිත බලපත්‍රය රැගෙන තැපැල් කාර්යාලයට ගිය පසු ආධාර මුදල් ගෙවීම් කරනු ලැබේ.

1.5 **මාසික මහජනාධාර දීමනා පටන් ගන්නා දිනය**

මහජනාධාර ගෙවිය යුත්තේ ගෙවීමට බලය දුන් මාසයේ පළමු දින සිට ෙ එය ගෙවිය යුත්තේ හිඟ හිටවමිනි. එනම්, ජනවාරි දීමනාව ගෙවිය යුත් පෙබරවාරි මාසයේදී ය.

...3/

1.6 මහජනාධාර නැවැත්වීම / අත්හිටුවීම

ආධාර ලබන්නෙකු නොකඩවා මාස තුනක් ආධාර ලබා නොගතහොත් ගෙවීම අත්හිටුවිය යුතුය. ආධාර මුදල අත්හිට වූ දිනයේ සිට මාස තුනක් ඇතුලත නැවත දීමනාව ඉල්ලා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් නොකළහොත් මහජනාධාර මුදල කපා හැරිය යුතුය. තවද, මහජනාධාර ලබන අයකුගේ පවුලේ ආර්ථික තත්වය යහපත් අතට හැරී ඇත්නම් ආධාර මුදල කපා හැරිය යුතුය. මෙය සංශෝධනය කරනු ලබන්නේ සමාජ සේවා නිලධාරී විසිනි. මේ සඳහා සමාජ සේවා නිලධාරී විසින් වාර්ෂිකව නැවත සෝදිසි කිරීමේ ආකෘති පත්‍රයක් මගින් මහජනාධාර ලබන්නන් නැවත පරීක්ෂා කර බලනු ලැබේ.

(අංක. එස්.එස්./පී./1(බී) දරන ආකෘති පත්‍රය)

1.7 තාවකාලික මහජනාධාර

හදිසියේ ඇතිවූ ආපදාවකදී තාවකාලිකව මාස 6 ක් සඳහා මහජනාධාර මාසික දීමනා ගෙවිය හැකිය.

2. රෝග ආධාර ගෙවීම

2.1 රෝගාධාර යනු පිළිකා, ක්ෂයරෝග හා ලාදුරු රෝගීන් සඳහා ගෙවනු ලබන ආධාර ගෙවීමයි. මේ අනුව ලාදුරු, පිළිකා හා ක්ෂයරෝගාධාර ලැබීමට සුදුසු අය වන්නේ,

දිළිඳු පවුල්වල බෝහෝ දුබල ශරීර සෞඛ්‍යයෙන් යුතු අය, රෝගී තත්වය නිසා තමන් සහ තමන්ගේ යැපෙන්නන් පෝෂණය කර ගැනීමට නොහැකි අය වෙති. ක්ෂයරෝගීන්, ලාදුරු රෝගීන් හා පිළිකා යන සියලු වර්ගවලට අයත් රෝගීන් සඳහා එකම ප්‍රමාණයකට ගෙවීම් කරනු ලැබේ.

රෝගීන් සඳහා ගෙවීම් කිරීමේදී බාහිර හා අභ්‍යන්තර යනුවෙන් කොටස් දෙකකට සීමා කර ඇත. අභ්‍යන්තර යනු රෝහල් ගත වූ රෝගියෙකි. බාහිර යනු රෝහලින් පිටත සිටින එහෙත් බෙහෙත් ගන්නා රෝගියෙකි.

2.2 බාහිර රෝගීන් සඳහා මසකට ගෙවීම්

| | |
|---|---|
| පවුලේ ප්‍රධානියා බාහිර රෝගියකු නම් | රු. 250/= |
| පළමු යැපෙන්නා (භාර්යාව) | රු. 100/= |
| වෙනත් යැපෙන එක් අයකුට | රු. 50/= (බැගින්) |
| *ගෙවිය හැකි උපරිම ආධාර මුදල | රු. 500/= |

2.3 <u>අභ්‍යන්තර රෝගීන් සඳහා මසකට ගෙවීම</u>

පවුලේ ප්‍රධානියාට ගෙවීම් කළ නොහැක. රු. 100/-
පළමු යැපෙන්නාට රු. 50/-
වෙනත් යැපෙන එක් අයකුට රු. 300/- වේ.
ගෙවිය හැකි උපරිම මුදල

2:4 වැඩිහිටි නිවාසයක හෝ පුණ්‍ය ආයතනයක පිළිකා රෝගියෙකු සිටී නම්, ඔහුට ගෙව
ලබන නඩත්තු ආධාරවලට අමතරව රු.250/-ක ආධාර මුදලක් ගෙවිය හැක.

2.5 <u>රෝගාධාර ලබා ගන්නා ආකාරය</u>

ඉහත සඳහන් රෝග වලින් පෙළෙන අය තමන් ප්‍රතිකාර ගන්නා රජයේ වෛද්‍ය
නිලධාරියා ගෙන් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළයුතුය. කොපමණ කාලයක් සඳහා
ආධාර නිර්දේශ කරන්නේද යන්න එහි සඳහන් විය යුතුය.

පිළිකා ආධාර සම්බන්ධයෙන් සහනාධාර නිර්දේශ කරන කාල සීමාව අදාල නො
මෙම වෛද්‍ය සහතික නියමිත මුද්‍රිත ආකෘති පත්‍රයේ විය යුතුය.

ලාදුරු රෝගීන් සඳහා වෛද්‍ය සහතික නිකුත් කරනු ලබන්නේ ලාදුරු මර්ධන
ව්‍යාපාරයේ වෛද්‍යවරයා විසිනි. එම වෛද්‍ය සහතික මාස 6 න් හයට
නිකුත් කරනු ලැබේ.

ප්‍රාදේශීය ලේකම්ට, ලැබෙන වෛද්‍ය සහතිකයට අනුව සමාජසේවා නිලධාරි
රෝගී පුද්ගලයා හමුවී නියමිත ආකෘතියේ වාර්තාවක් ලබා ගෙන තම නිර්දේශය
සමග අනුමැතිය සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කළ යුතුය. ප්‍රාදේශීය
ලේකම් ගේ අනුමැතිය ලැබුණු පසු ගෙවීම් කළ හැකිය. මුදල් ගෙවනු ලබ
ආධාර ලාභියා කැමති කිට්ටුම තැපැල් කාර්යාලයෙනි. ආධාර මුදල් ගෙවීම
එස්.එස්./පී/2 ආකෘතිය භාවිතා කෙරේ.

ලාදුරු ආධාර ගෙවීම සමාජ සේවා නිලධාරී විසින් එස්.එස්..එල්.
දරණ ආකෘතියේ වාර්තා ලබා ගෙන නිර්දේශ කර ප්‍රාදේශීය ලේකම් ..
ලවා අනුමත කරවා ගතයුතුය. අනුමැතිය ලැබුණු පසු මුදල් ඇනවුම් පත්
ලාදුරු රෝගාධාර සඳහා ගෙවීම් කරනු ලැබේ.

2.6 <u>රෝගාධාර අත්හිටුවීම හෝ නැවැත්වීම.</u>

රෝගියා ප්‍රතිකාර ලබන තෙක් වෛද්‍යවරයා විසින් සහතික නිකුත් කෙරේ. ප්‍රතිකාර ගැනීම නැවතුන හොත් වෛද්‍ය සහතික නොලැබෙන අතර, ආධාර මුදල් ගෙවීම ඒ මත අත්හිටවනු ලැබේ.

රෝගියාගේ මරණය හෝ රෝගය සුව වීමෙන් පසු ආධාර ගෙවීම් නවත් වනු ලැබේ.

2.7 පවුලේ ප්‍රධානියා වන රෝගියකුගේ යැපෙන්නකු වන හෝ නොවන පවුලේ වෙනත් සාමාජිකයකු ඉහත රෝගයන් වැළඳී බාහිර ප්‍රතිකාර ලබයි නම්, ඔහු වෙනුවෙන් රු. 250/= බැගින් අතිරේක ආධාර මුදලක් ගෙවිය හැකිය.

2.8 පවුලේ ප්‍රධානියා රෝගියකු නොවී ඔහුගේ යැපෙන්නකු හෝ වෙනත් සාමාජිකයකු ඉහත රෝගයකින් පෙළෙන්නේ නම්, එවැනි අයෙකු වෙනුවෙන් රු. 250/= බැගින් මාසික ආධාර මුදලක් ගෙවිය හැකිය.

2.9 ස්වේච්ඡා සංවිධාන මගින් පවත්වා ගෙන යනු ලබන වැඩිහිටි නිවාසයක හෝ වෙනත් පුණ්‍යායතනයක නැවතී සිටින අයෙකු පිළිකා රෝගයෙන් පෙළෙන්නේ නම්, ඔහු වෙනුවෙන් එම නිවාසයට ලැබෙන වෙනත් නඩත්තු ආධාර ආදිය නොසලකා රෝගියකු සඳහා ගෙවිය හැකි රු. 250/= ක ආධාර මුදල ගෙවිය යුතුය.

2.10 <u>යැපෙන්නන්.</u>

පවුලෙන් යැපෙන්නන් වශයෙන් සැලකිය යුත්තේ පහත සඳහන් අය වේ.

1. භාර්යාව (ප්‍රධාන යැපෙන්නා)
11. අවු: 16 ට අඩු දරුවන්
111. පවුල සමඟ ජීවත්වන ස්වාමි පුරුෂයාගේ හෝ භාර්යාවගේ දෙමව්පියන්
1V. පවුල සමඟ ජීවත්වන ශාරීරික / මානසික දුබලතාවන්ගෙන් පෙළෙන වැඩිහිටි දරුවන් හෝ එවැනි වෙනත් අය.

ඉහත අංක 111, 1V, සඳහන් අය යටත් පිරිසෙයින් පසුගිය මාස 6 තුළ පවුල සමඟ ජීවත් වී ඇත්නම්, සහ පවුලේ ප්‍රධානියා විසින් නඩත්තු කරනු ලැබ ඇත්නම්, ඔවුන් යැපෙන්නන් සේ සැළකිය යුතුය.

2.11 <u>රෝගියෙකු වූ පවුලේ ප්‍රධානියා මිය ගිය විට මරණය සිදු වූ මාසයට පසු මාස 3 ක්</u> දක්වා නියමිත ආධාර මුදල පළමුවන යැපෙන්නා ගෙවිය හැකිය.

2.12. රෝග ආධාර ලබන පවුල්වල සාමාජිකයෝ මහජනාධාර මාසික දීමනා ලැබීමට සුදුස්සෝ නොවෙති.

2.13. ස්වාමි පුරුෂයා සුවකළ නොහැකි රෝගයකින් පෙළෙන ස්ත්‍රීන්, බන්ධනාගාර ගතවීම නි හේතුවෙන් මිය ස්වාමිපුරුෂයාගේ ආධාර නොලබන භාර්යාවන් හා වැන්දඹුවන් ද පවුලේ ප්‍රධානියා සේ සැලකීමට හැකි වේ.

03. <u>පුනරුත්ථාපන ආධාර ලබාදීම</u>

3.1. <u>පුනරුත්ථාපන ආධාර ලැබීමට සුදුස්සෝ</u>

මහජන ආධාර මුදලක් ලබන එහෙත් කිසියම් ස්වයං රැකියාවක් කිරීමට හැකි ශරීරශ ඇති අය පුනරුත්ථාපන ආධාර ලැබීමට සුදුස්සෝ වෙති. විශේෂයෙන් වැන්දඹුවන් මේ සටහේ සලකා බැලිය යුතුය.

3.2. <u>ආබාධිත පුනරුත්ථාපනය</u>

මහජන ආධාර ලබන මානසික හෝ ශාරීරික වශයෙන් ආබාධිත අයට ස්වයං රැකි කර ගෙනයාමට තරම් හැකියාවක් තිබේ නම් ඒ අයටද පුනරුත්ථාපන ආධාරය ලබ හැකිය.

3.3. <u>පුනරුත්ථාපන ආධාර මුදල ලබා ගන්නා ආකාරය</u>

මහජනාධාරලාභියාට තම ලිපිනය, මහජනාධාර අංකය, ආධාර ලබාගත් කාල කාර්යාලය ආදී විස්තර සහිතව තමා කිරීමට බලාපොරොත්තුවන ස්වයං රැකියාව සම්බන්ධ විස්තර සමඟ තමන් පදිංචි කොට්ඨාශයේ සමාජ සේවා නිලධාරී වෙත ලිපියකින් ඉල්ලුම් කළ හැකිය.

ඉන්පසු සමාජ සේවා නිලධාරී විසින් අදාල වාර්තා ලබාගෙන කිරීමට බලාපො එන ස්වයං රැකියාවේ ඇස්තමේන්තුව නිර්දේශ කර රු: 2500/=ක් ගෙවීම අනුමැතියට යවනු ලබන අතර, මෙම අනුමැතිය ප්‍රාදේශීය ලේකම් ගෙන් ලබ යුතුය. ආධාර මුදල ගෙවනු ලබන්නේ කොටස් වශයෙනි.

එන්. ඩබ්ලිව්. ර. විජේවන්ත.
සමාජසේවා අධ්‍යක්ෂ.

...ස්තමේන්තුව,